# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.05 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/649/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2025.04.04 වන දින අළුයම් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස් පුර ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොටහේන පොලිස් ස්ථානය.

2025.04.05 වන දින අළුයම් කාලයේ කොටහේන පොලිස් වසමේ පරමානන්ද මාවත ප්‍රදේශයේදී කොටහේන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටහේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මන්නාරම කොට්ඨාස දූෂණ මධර්න අංශය.

2025.04.04 වන දින රාත්‍රී කාලයේ මන්නාරම පොලිස් වසමේ පුදුකේරු ප්‍රදේශයේදී මන්නාරම කොට්ඨාස දූෂණ මධර්න අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන උප්පුකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධී ලෙස විදේශීය දුම්වැටි තොගයක් ගුවන් මගින් මෙරටට රැගෙන එන ලද සැකකාරියක් අත්අඩංගුවට - මත්ද්‍රව්‍ය කායර්ංශය ගුවන්තොටුපල ඒකකය.

2025.04.04 වන දින රාත්‍රී කාලයේ කටුනායක ගුවන්තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන්ට විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස විදේශීය දුම්වැටි 10,000 (කාටුන් 50 ක්)**

ඩුබායි රාජ්‍යයේ සිට මෙරටට ගුවන් මගින් රැගෙන පැමිණි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 48 ක් වන පොල්ගහවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. ගංජා ගස්, ගෝඩා සහ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගලේවෙල පොලිස් ස්ථානය.

2025.04.04 වන දින දහවල් කාලයේ ගලේවෙල පොලිස් වසමේ වැමැඩිල්ල ප්‍රදේශයේදී ගලේවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හේන් ගොවිතැන් කරන මුවාවෙන් ගංජා වගාවක් පවත්වාගෙන ගිය පුද්ගලයෙකු අඩි 13 ක් පමණ උසට වැවී තිබූ ගංජා ගස් 07 ක්, ගෝඩා ලීටර් 181 ක් අඩංගු බැරල් 01 ක් සහ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන වහකෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගලේවෙල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - අම්බලන්ගොඩ පොලිස් වසම

2025.04.04 වන දින රාත්‍රී කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ අම්බලන්ගොඩ තිලකපුර මාගර්යේ යකඩ පාලම ආසන්නයේදී තල්ගස්ගොඩ දෙස සිට අම්බලන්ගොඩ දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව යකඩ පාලමේ ගැටී මාගර්ය හරහා පෙරළී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ත්‍රීරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු බරපතල තුවාල ලබා පොල්වත්ත රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහලට මාරුකර යවා එහි ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ වතුගෙදර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**